# දේව විශ්වාසය

මහමාන්කඩවල ධම්මසිරි හිමි – ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක

ලෝකය විවිධ සත්ව සමූහයන්ගෙන් ! සංකීර්ණව පවතී. එසේ වුවද, එහි මිනිස් ඇසට පෙනෙන නොපෙනෙන වශයෙන් කොටස් දෙකකි. අප ඇසට පේන සත්වයන් පිළිබඳ අපට ප්‍රමාණවත් දැනුමක් තිබේ. ඔවුන් පිළිබඳ අප හද පත්ලේ සැකයක් ගොඩ නොනැගේ. එහෙත් චක්ෂුරාදී වඩා ඉන්ද්‍රියයන්ට ගොදුරු නොවන ඉතා සියුම් ශරීර ඇති සත්වයන් සිටින බව ඉතා සත්‍ය කරුණකි. එය බුදු දහමින් පමණක් නොව වෛද්‍ය විද්‍යාවෙන්ද හෙළිකොට ඇත. ඇමිබාවන් වැනි අන්වීක්ෂයකින් දැකිය හැකි සත්වයෝද වෙති. ලෝකයේ පවතින සැම දෙයක්ම අප ඇසට ගෝචර නොවේ. එසේ ගෝචර නොවන ප්‍රාණීන් සැලකිය යුතු කොටසකි දෙවියන්. මොවුන් පියවි ඇසයට නොපෙනුණද නැතැයි ප්‍රතික්ෂේප කිරීම වරදකැයි බුදු දහමින් හෙළිවෙන සාධක දෙස බලනවිට පෙනේ. අත්ථි සත්තා ඔපපාතිකා ගණයට දෙවියන්ද ඇතුළත් කළ හැකිය.

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කර වදාළ ත්‍රිපිටක ධර්මය දෙස බලන විට එහි නොයෙක් තැන්වල දෙවියන් ගැන සඳහන් වනු පෙනේ. ත්‍රිපිටකයේ දෙවියන් ඇතැයි හෙළිකෙරෙන ප්‍රසිද්ධස්ථාන කීපයක් මෙසේ උපුටා දැක්විය හැකිය.

සූත්‍ර පිටකයේ සංයුක්ත නිකායට අයත් දේවතා සංයුක්තය දෙස බලමු. එහි විස්තර වන්නේ බුදුරජාණන් වහන්සේ හා දෙවියන් අතර පැවති ප්‍රශ්නෝත්තර ක්‍රමයෙන් දේශිත – ධර්ම කරුණු රාශියකි.

සැරියුත් හිමියන් ආයුකාලය අවසන් කිරීම සඳහා තම මෑණියන් වෙසෙන නිවසට වැඩම කළ සේක. එම අවස්ථාවේ මහා බ්‍රහ්මයා, ශක්‍ර දේවේන්ද්‍රයා ආදී මහේශාක්‍ය දෙවියන් සැරියුත් හිමියන්ගේ ලෙඩ ඇඳ වෙත පැමිණ නමස්කාර කොට සැපසනීප ආදී සතුටු සාමීචි කතා කළ බව බෞද්ධ සාහිත්‍යයේ එයි. එමෙන්ම දෙවියන්ට කළ ධර්ම අවවාදය අසා සිටි තම අබෞද්ධ මෑණියන් බෞද්ධවී මාර්ගඵල අවබෝධ කරගත් බවද සඳහන් කරනු ලැබේ. සෘද්ධිමතුන් අතර අග තැන්පත් මුගලන් හිමියන් දෙව් ලොවට වැඩම කොට දෙවියන් සමග සතුටු සාමීචියේ යෙදුණ බොහෝ අවස්ථා ධර්ම ග්‍රන්ථවලින් හෙළි වේ.

බෝධිසත්ව චරිතය දෙස බලනවිට මනුලොව ඉපදීමට නියම කාලය මේ යැයි ආරාධනා කර ඇත්තේ දෙවියන් බව ප්‍රකට කරුණකි. කාලො යංතේ මහාවීර උප්පජ්ජ මාතු කුච්ජියං එමෙන්ම බෝසතුන්ට පැවිදි වීමට අටපිරිකර පුදන ලද්දේ සටිකාර මහබඹු විසිනි. මෙවැනි බෞද්ධ ධර්ම කරුණු පිරික්සීමේදී දෙවින් ඇතැයි නිගමනය කළ හැකිය. මෙසේ වාසය කරන දෙවියන් ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය.

1. අහස් වැසි දෙවියෝ (සදෙව් ලොව වැසි වූද බඹලොව වැසි වූද දෙවියන්)

2. භූමාටු දෙවියෝ (වෘක්ෂලතා, පර්වතා, ගෘහ වස්තු ආදිය විමාන කොට ගත් දෙවියන්.)

දෙවියන් හා මිනිසා අතර ඇති සම්බන්ධතාවය දීර්ඝකාලීනව පැවතෙන්නෙකි. මිනිසා හැම අවස්ථාවකම දෙවියන්ගේ ආරක්ෂාව බලාපොරොත්තු විය. එසේ ආරක්ෂාව අපේක්ෂා කළ බෞද්ධයා නිරන්තරයෙන්ම දෙවියන් ඇදහීම වෙනුවට තෙරුවන් වැඳ ලබා ගන්නා පින් කරුණාවෙන්, මෛත්‍රියෙන්, දෙවියන්ට අනුමෝදන් කළේය. සිල්වත්, ගුණවත් ශ්‍රද්ධාවන්ත ගිහියන්ට ආරක්ෂාව සලසා දෙවියන් ඔවුන් ප්‍රතිපත්තිගරුක භාවයට නමස්කාර කරන බවද බෞද්ධ ධර්ම පුස්තකයන්ගෙන් සනාථ වෙයි. එසේම සාධකයක් ලෙස ශක්‍ර දේවේන්ද්‍රයන් මනුලොවට වැඩීමේ පුවත දැක්විය හැකිය.

පියවි ඇසට නොපෙනෙන ඉතා සියුම් සිරුරු ඇති දෙවියන් ඇතැයි විශ්වාස කිරීමට මෙම ධර්ම කරුණු ඉතා ප්‍රමාණවත් වෙයි. එසේම විමනා වස්තුව, නන්ද හිමියන් දෙව්ලොව ගෙනයෑම, දිව්‍ය කුමාරිකාව සියැසින් දැක්ම – දීඝනිකායේ එන මහා සමය සූත්‍ර දේශනාව හා අටුවාගත අභිධර්ම නිදානය යන මේවා දෙවියන් පිළිබඳ ව දක්වෙන විශේෂ අවස්ථා හැටියට දැක්විය හැකිය. මහා වංශයට අනුව ලංකා ඉතිහාසය දෙස බලන විට රුවන්මැලි චෛත්‍යය ස්ථානයේ ස්වර්ණමාලි නමින් වෘක්ෂ දෙව් දුවක් සිටි බවද ඇය සිහිකිරීමට ස්වර්ණ මාලි චෛත්‍යය යන නම යෙදූ බවද මහාවංශයට අනුව පෙනේ.

මෙවැනි කරුණුවලින් දෙවියන් ඇති බවද ඔවුන් පිදීමක් නොකොට පිං අනුමෝදන් කිරීම බෞද්ධ සිරිත බවද සද්ධාව, කරුණාව, මෛත්‍රිය, මත මිනිසුන් හා දෙවියන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් ගොඩනැගී ඇති බවද බෞද්ධ සාහිත්‍යයේ ධර්ම ග්‍රන්ථවලින් සනාථ කරනු ලැබේ.